# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2019 අංක 10 දරන මෝටර් වාහන (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2019 ජුනි මස 20 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2019 ජුනි මස 21 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකි ය.

**මිල :** රු. 12.00 **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2019 අංක 10 දරන**
**මෝටර් වාහන (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2019 ජුනි මස 20 වන දින]

එල්.ඩී.—ඕ. 53/2017

## (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2019 අංක 10 දරන මෝටර් වාහන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 123 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 203 වන අධිකාරයේ 123 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ -

(අ) එහි (අ) ඡේදයේ, එම ඡේදය අවසානයේ දැක්වෙන "තව ද" යන වචනය ඉවත් කිරීමෙන්;

(ආ) එහි (ආ) ඡේදයේ, එම ඡේදය අවසානයට "සහ" යන වචනය ඇතුළත් කිරීමෙන්;

(ඇ) එහි (ආ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:—

"(ඇ) වයස අවුරුදු දහඅට සම්පූර්ණ කරනු ලැබ ඇත්නම් මිස මාර්ගයක සැහැල්ලු වාහනයක් ධාවනය කිරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු අතර, වයස අවුරුදු විසි එක සම්පූර්ණ කරනු ලැබ ඇත්නම් මිස මාර්ගයක බර වාහනයක් ධාවනය කිරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය.".

(2) එම වගන්තියේ (5) වන උපවගන්තියේ -

(අ) එහි (අ) ඡේදයේ "රුපියල් තුන්දහසකට නොඅඩු සහ රුපියල් හයදහසකට නොවැඩි දඩයකට" යන වචනවල සිට එම ඡේදය අවසානය දක්වා ඇති සියලුම වචන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන්:—

"රුපියල් විසිපන්දහසකට නොඅඩු සහ රුපියල් තිස්දහසකට නොවැඩි දඩයකට සහ දෙවන හෝ පසු අවස්ථාවක දී වරදකරු කරනු ලැබීමේ දී රුපියල් තිස්දහසකට නොඅඩු සහ රුපියල් පනස්දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් වන්නේ ය.";

(ආ) එහි (ආ) ඡේදයේ "රුපියල් හාරදහසකට අඩු නොවන සහ රුපියල් අටදහසකට වැඩි නොවන දඩයකට" යන වචනවල සිට එම ඡේදය අවසානය දක්වා ඇති සියලුම වචන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන්:—

"රුපියල් විසිපන්දහසකට නොඅඩු සහ රුපියල් තිස්දහසකට නොවැඩි දඩයකට සහ දෙවන හෝ පසු අවස්ථාවක දී වරදකරු කරනු ලැබීමේ දී රුපියල් තිස්දහසකට නොඅඩු සහ රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.";

(ඇ) එහි (ආ) ඡේදයට ඉක්බිතිව ම, එහි (ඇ) ඡේදය වශයෙන් බලාත්මක විය යුතු, පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:—

"(ඇ) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබීමේ දී රුපියල් තිස්දහසකට නොඅඩු සහ රුපියල් හතළිස් දහසකට නොවැඩි දඩයකට සහ දෙවන හෝ පසු අවස්ථාවක දී වරදකරු

කරනු ලැබීමේ දී රුපියල් හතළිස් දහසකට නොඅඩු සහ රුපියල් පනස්දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් වන්නේ ය.''.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 141 වන වගන්තියට ඉක්බිතිව ම පහත අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 141අ වන වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය:—

ප්‍රධාන ප්‍රඥප්තියට 141අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

''අධි වේගයෙන් රිය පැදවීම සඳහා වූ දණ්ඩනය.

141අ. (1) 140, 141 සහ 142 වන වගන්තිවල විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගයක් උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී -

(අ) නියමිත වේග සීමාව සියයට විස්සක් දක්වා ඉක්මවන අවස්ථාවක දී රුපියල් තුන්දහසකට නොඅඩු සහ රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට;

(ආ) නියමිත වේග සීමාව සියයට විස්ස ඉක්මවන සහ සියයට තිහ නොඉක්මවන අවස්ථාවක දී රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දසදහසකට නොවැඩි දඩයකට;

(ඇ) නියමිත වේග සීමාව සියයට තිහ ඉක්මවන සහ සියයට පනහ නොඉක්මවන අවස්ථාවක දී රුපියල් දසදහසකට නොඅඩු සහ රුපියල් පහළොස්දහසකට නොවැඩි දඩයකට; සහ

(ඈ) නියමිත වේග සීමාව සියයට පනහ ඉක්මවන අවස්ථාවක දී රුපියල් පහළොස්දහසකට නොඅඩු සහ රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට,

යටත් වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, 140, 141 සහ 142 වන වගන්තිවල විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු, 215අ වන වගන්තිය යටතේ නියම කරනු ලැබිය හැකි ස්ථානීය දඩයන්ට ද යටත් විය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියට 148අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 148 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 148අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:–

"දුම්රිය මාර්ගය හරහා මාරුවීමේ දී පූර්වාරක්ෂාවන්.

148අ. (1) කිසිදු තැනැත්තකු විසින්–

(i) දුම්රිය ගේට්ටුව වසා ඇති විටෙක;

(ii) දුම්රිය සංඥා පද්ධති නොසලකා හරිමින්; හෝ

(iii) බලයලත් නිලධරයකුගේ විධානයන්ට කීකරු නොවෙමින්,

තමාගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ ආරක්ෂාවට අනතුරක් සිදුවීමට ඉඩ ඇති ආකාරයෙන් දුම්රිය හරස් මාර්ගය මත හෝ ඒ හරහා මෝටර් වාහනයක් නොපැදවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන තැනැත්තකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් විසිපන්දහසකට නොඅඩු හා රුපියල් තිස්දහසකට නොවැඩි දඩයකට සහ දෙවන වරට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් තිස්දහසකට නොඅඩු හා රුපියල් හතළිස්දහසකට නොවැඩි දඩයකට හා මාස හයකට නොවැඩි කාලයක් සඳහා ඔහුගේ රියදුරු බලපත්‍රය අත්හිටුවීමට සහ තුන්වන හෝ පසු අවස්ථාවක දී වරදකරු කරනු ලැබීමේ දී රුපියල් හතළිස්දහසකට නොඅඩු හා රුපියල් පනස්දහසකට නොවැඩි දඩයකට හා මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා ඔහුගේ රියදුරු බලපත්‍රය අත්හිටුවනු ලැබීමට ඔහු යටත් විය යුතු ය.".

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 152 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 152අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:– ප්‍රධාන ප්‍රඥප්තියට 152අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"මෝටර් වාහනයක් ධාවනය කරන විට ජංගම දුරකතනය ආදිය භාවිතය තහනම් කිරීම.

152අ. (1) කිසිදු තැනැත්තකු විසින්, මාර්ගයක මෝටර් වාහනයක් ධාවනය කරන විට දුරකතනයක්, ජංගම දුරකතනයක් හෝ වෙනත් යම් වංචල සන්නිවේදන උපකරණයක් භාවිත නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය උල්ලංඝනය කරන තැනැත්තකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී 224 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති දණ්ඩනයට මෙන්ම 215අ වගන්තිය යටතේ නියම කරන ලද ස්ථානීය දඩ මුදලකට යටත් විය යුතු ය.".

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 196 වන වගන්තිය, එහි (5) වන උපවගන්තියේ (ආ) ඡේදයේ අතුරු විධානයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:– ප්‍රධාන ප්‍රඥප්තියේ 196 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඇ) මෙම උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන තැනැත්තකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී 224 වන වගන්තියේ නිශ්චිතව දැක්වා ඇති දණ්ඩනයට මෙන්ම 215අ වගන්තිය යටතේ නියම කරන ලද ස්ථානීය දණ්ඩනයට යටත් විය යුතු ය.".

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 216 වන වගන්තියේ "රුපියල් තුන්දහස් පන්සියයකට නොඅඩු" යන වචනවල සිට එම වගන්තියේ අවසානය දක්වා ඇති සියලුම වචන ඉවත් කර ඒ වෙනුවට "රුපියල් විසිපන්දහසකට නොඅඩු හා රුපියල් තිස්දහසකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම සහ මාස දෙළහකට නොවැඩි කාලයක් සඳහා ඔහුගේ රියදුරු බලපත්‍රය අත්හිටුවනු ලැබීමට හෝ යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 216 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 216අ වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 216අ වන වගන්තියේ "රුපියල් හාරදහසකට නොඅඩු" යන වචනවල සිට එම වගන්තියේ අවසානය දක්වා ඇති සියලුම වචන ඉවත් කර ඒ වෙනුවට "රුපියල් විසිපන්දහසකට නොඅඩු හා රුපියල් තිස්දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම සහ ඔහුගේ රියදුරු බලපත්‍රය අවලංගු කරනු ලැබීමට ද ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 216අ වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 216ආ වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 216ආ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

(අ) එහි (අ) ඡේදයේ "අවුරුදු දෙකකට නොඅඩු වූ ද" යන වචනවල සිට එම ඡේදයේ අවසානය දක්වා ඇති සියලුම වචන ඉවත් කර ඒ වෙනුවට "රුපියල් එක් ලක්ෂයකට නොඅඩු හා රුපියල් එක් ලක්ෂ පනස් දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොඅඩු හා අවුරුදු දහයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හා ඔහුගේ රියදුරු බලපත්‍රය අවලංගු කරනු ලැබීමට," යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එහි (ආ) ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:–

"(ආ) ඒ තැනැත්තා විසින් -

(i) යම් තැනැත්තකුට තුවාලයක් සිදුකරන අවස්ථාවක, රුපියල් තිස් දහසකට නොඅඩු හා රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුද්දකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හා ඔහුගේ රියදුරු බලපත්‍රය අවලංගු කරනු ලැබීමට; හෝ

(ii) යම් තැනැත්තකුට බරපතළ තුවාලයක් සිදුකරන අවස්ථාවක, රුපියල් පනස් දහසකට නොඅඩු හා රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හා ඔහුගේ රියදුරු බලපත්‍රය අවලංගු කරනු ලැබීමට,

යටත් විය යුතු ය.''.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 217 වන වගන්තිය පහත දැක්වන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

ප්‍රධාන ප්‍රඥප්තියේ 217 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ ''රුපියල් එක්දහස් පන්සියයට නොඅඩු'' යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා ඇති සියලුම වචන ඉවත් කර ඒ වෙනුවට ''රුපියල් දසදහසකට නොඅඩු හා රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට සහ දෙවන වරට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පහළොස්දහසකට නොඅඩු හා රුපියල් තිස්දහසකට නොවැඩි දඩයකට සහ ඔහුගේ රියදුරු බලපත්‍රය අත්හිටුවීමට සහ තුන්වන වරට හෝ පසු වාරයක දී වරදකරු කරනු ලැබීමේ දී රුපියල් විසිදහසකට නොඅඩු හා රුපියල් හතළිස්දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා බරපතළ වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හා ඔහුගේ රියදුරු බලපත්‍රය අවලංගු කරනු ලැබීමකට යටත් විය යුතු ය.''; හා

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ ''රුපියල් එක්දහස් පන්සියයට නොඅඩු'' යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා ඇති සියලුම වචන ඉවත් කර ඒ වෙනුවට ''රුපියල් දසදහසකට නොඅඩු හා රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට හා දෙවන වරට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පහළොස්දහසකට නොඅඩු හා රුපියල් තිස්දහසකට නොවැඩි දඩයකට සහ තුන්වනවරට හෝ පසු වාරයක දී

වරදකරු කරනු ලැබීමේ දී රුපියල් විසිදහසකට නොඅඩු හා රුපියල් හතළිස්දහසකට නොවැඩි දඩයකට හා මාස හයක කාලයක් සඳහා ඔහුගේ රියදුරු බලපත්‍රය අත්හිටවනු ලැබීමට,

යටත් විය යුතු ය.”.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 218 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 218 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:–

“රක්ෂණ සහතිකය නොමැතිව රිය පැදවීම සඳහා වූ දණ්ඩනය.

218. 99 වන වගන්තියේ විධිවිධාන කඩකරනු ලබන තැනැත්තකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් විසිපන්දහසකට නොඅඩු හා රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ මාසයකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම ඔහු යටත් විය යුතු ය.”.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 224 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 224 වන වගන්තියේ “රුපියල් දෙදහස් පන්සියයකට නොඅඩු” යන වචනවල සිට එම වගන්තියේ අවසානය දක්වා ඇති සියලුම වචන ඉවත් කර ඒ වෙනුවට “රුපියල් දෙදහස් පන්සියයකට නොඅඩු සහ රුපියල් හත්දහස් පන්සියයකට නොවැඩි දඩයකට ද දෙවන වරට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් හත්දහස් පන්සියයකට නොඅඩු සහ රුපියල් පහළොස්දහසකට නොවැඩි දඩයකට ද, තුන්වන හෝ පසු අවස්ථාවක දී වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පහළොස්දහසකට නොඅඩු සහ රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට ද යටත් විය යුතු ය.” යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.*

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

(1) එහි 10 වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:–

“

| | වගන්තිය | විධිවිධානය |
|---|---|---|
| 10. | 140, 141 සහ 142 | - වේග සීමාවන්ට අනනුකූලව ධාවනය කිරීම |
| | 141අ (1) (අ) | - නියමිත වේග සීමාව ඉක්මවා සියයට විස්සක් දක්වා ධාවනය කිරීම |
| | 141අ (1) (ආ) | - නියමිත වේග සීමාව සියයට විස්ස ඉක්මවා සහ සියයට තිහ නොඉක්මවා ධාවනය කිරීම |
| | 141අ (1) (ඇ) | - නියමිත වේග සීමාව සියයට තිහ ඉක්මවා සහ සියයට පනහ නොඉක්මවා ධාවනය කිරීම |
| | 141අ (1) (ඈ) | - නියමිත වේග සීමාව සියයට පනහ ඉක්මවා ධාවනය කිරීම |

;”;

(2) එහි 12 වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කරනු ලබන අතර, එය එහි 12 (අ) අයිතමය ලෙස බලාත්මක විය යුතු ය:–

“

| | වගන්තිය | විධිවිධානය |
|---|---|---|
| 12 අ. | 152අ | - මෝටර් වාහනයක් ධාවනය කරන විට ජංගම දුරකතන භාවිතය |

;”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**14.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.